සැ. යු.-2011.04.29 දින පළ වූ අංක 1,704 දරන ගැසට් පත්‍රයේ I – III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,705 - 2011 මැයි මස 06 වැනි සිකුරාදා - 2011.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 606 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 611 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මැයි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අප්‍රේල් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

603- B 808221— 8,850 (2011/05)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරිමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**අධිකරණ අමාත්‍යාංශය**

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ (හදිසි) මරණ පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශවල පුරප්පාඩු වී ඇති (හදිසි) මරණ පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර "ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12" වෙත 2011.05.31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "(හදිසි) මරණ පරීක්ෂක තනතුර ............ දිස්ත්‍රික්කය" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම තනතුර රජයේ ස්ථිර තනතුරක් නොවේ. මෙම තනතුර වයස අවුරුදු 65 වන තෙක් වලංගු වන පරිදි දෙනු ලබන අතර අදාළ එම නිර්දේශයන් සහ වෛද්‍ය සහතික ලබා ගැනීමෙන් පසු ඒ අනුව වයස අවුරුදු 70 දක්වා දීර්ඝ කරනු ලැබිය හැකිය. එහෙත් ඉන් පෙර ඕනෑම අවස්ථාවක (හදිසි) මරණ පරීක්ෂකවරයෙකු හේතු දක්වා අමාත්‍යවරයා විසින් සේවයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. පත්වීම් දෙනු ලබන පුරප්පාඩු වී ඇති (හදිසි) මරණ පරීක්ෂක කොට්ඨාශ පහත සඳහන් උපලේඛනයේ සඳහන් වේ.

04. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව (හදිසි) මරණ පරීක්ෂකවරුන්ගේ කාර්යයන් පත්වීම් ලාභීන් විසින් ඉටුකළ යුතු වේ.

05. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එසේ වුව ද මරණ පරීක්ෂණයක් සඳහා රු. 500 ක ගාස්තුවක්ද, මරණ පරීක්ෂකවරුන් සඳහා අනුමත ගමන් වියදම් හා සංයුක්ත දීමනා ද ගෙවනු ලැබේ.

06. පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති අයවලුන්ට පමණක් අයදුම් කළ හැක.

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) පත්වීම අපේක්ෂා කරන ප්‍රදේශයේ පසුගිය වසර දෙක තුළ ස්ථිර පදිංචිකරුවකුව සිටීම.
(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අවුරුදු 30ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතුය.
(ඈ) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී විෂයයන් 03කින් සාමාර්ථය ලබා තිබීම.
(මෙහිදී විද්‍යා විෂයයන්ගෙන් සාමාර්ථය ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ).
(ඉ) හදිසි මරණ පරීක්ෂණ තනතුර (මුස්ලිම්) සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්ට දෙමළ භාෂාවෙන් කතා කිරීමේ හා ලිවීමේ හැකියාව තිබිය යුතුය.
(ඊ) මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්වයකින් හෙබි අයෙකු විය යුතුය. මත්පැන් පාවිච්චියෙන් සහ දුම්පානයෙන් තොර තැනැත්තන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

07. අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට රජයේ, පළාත් සභා අරමුදලකින් හෝ පළාත් පාලන ආයතනයක අරමුදලකින් වැටුපක් හෝ දීමනාවක් ලබන තැනැත්තන්ද, රාජ්‍ය සංස්ථාවල සහ සමුපකාර සමිතිවල සේවකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද, පළාත් සභා මන්ත්‍රීවරුන් හෝ පළාත් පාලන ආයතනවල සභිකයන්ද මෙම තනතුර සඳහා අයදුම් කිරීමට නුසුදුස්සෝ වෙති.

08. ඉල්ලුම්පත්‍රය සමඟ කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය. එසේ වුව ද සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් සියලුම සුදුසුකම් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර, පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සහතික,
(ඇ) ජාතික හැඳුනුම්පත,
(ඈ) ස්ථිර පදිංචිය සනාථ කෙරෙන ග්‍රාම නිලධාරි සහතිකය,
(ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,
(ඊ) අතිරේක සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඇති වෙනත් සහතික තිබේ නම් එම සහතික,
(උ) විශ්‍රාමික අයදුම්කරුවන් විසින් විශ්‍රාම ගත් දිනය සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි.

09. සියලුම අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතියට අනුකූලව පැහැදිලි අකුරින් සම්පූර්ණ කර තිබිය යුතුය. අවශ්‍ය තොරතුරු සියල්ල ඇතුළත් නොකර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ඉල්ලුම්පත් ආකෘති පිරවීමේදී යෝග්‍යතා නිර්ණායක පිළිබඳ නිවැරදි විස්තර ඇතුළත් කළ යුතුය. ඉහත 07 වැනි ඡේදයේ සඳහන් ගණයකට අයත් හෝ අංක 06 හෝ 08 යන ඡේද සඳහා අසත්‍ය තොරතුරු සපයන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගෙන පත්වීම් දීමෙන් අනතුරුව සත්‍ය තත්වය ඔප්පු වුවහොත් එබඳු අයදුම්කරුවන්ගේ පත්වීම් වහාම අවලංගු කරනු ලැබේ.

11. තව ද හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් පත්කරනු ලැබීමෙන් පසුව ඉහත 07 ඡේදයේ තනතුරකට පත්වුවහොත් එසේ පත්වීම ලද දින සිට මෙකී පත්වීම අහෝසි වේ.

සුහද කේ. ගමලත්,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2011 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

**හදිසි මරණ පරීක්ෂක තනතුර**

| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | |
| අදාළ මහේස්ත්‍රාත් අධිකරණය | | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | |
| අදාළ පොලිස් ස්ථානය | | පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංකය | |

01. (අ) මුලකුරු සමග නම (පැහැදිලි අකුරෙන්) :———.
(පෙලපත් නාමය යටින් ඉරක් අඳින්න)
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :———.
02. ලිපිනය :———.
03. දුරකථන අංකය :———.
04. උපන් දිනය :———.

05. 2011.05.31 දිනට වයස : අවු. :——. මාස :——. දින :——.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :———.

07. අධ්‍යාපන සුදුසුකම්

(i) *අ. පො. ස. (සා. පෙළ) විභාගය :———.*

| *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* | *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගය :———.

| *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* | *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

08. වෘත්තීය සුදුසුකම් :———.

09. වර්තමාන රැකියාව :———.

10. කලින් කරන ලද රැකියාව :———.

11. (අ) රජයේ/රාජ්‍ය සංස්ථාවක/පළාත් සභාවක, සමුපකාර හෝ පළාත් පාලන ආයතනයක රැකියාවක් කරන්නේ ද? :——.

(ආ) එවැනි සේවයකින් අස්වී/විශ්‍රාම ගොස් ඇත්නම්, අස්වීමට/විශ්‍රාම යාමට හේතුව :———.

(ඇ) අස්වීම/විශ්‍රාම යාම අනුමත කළ දිනය :———.

12. (අ) ඔබට විරුද්ධව කිසියම් කලක සේවා යෝජකයා විසින් විනයානුකූලව කටයුතු කර තිබේද? :———.

(ආ) එසේ නම්, චෝදනාවේ ස්වභාවය හා ප්‍රතිඵලය :———.

13. (අ) (i) යම්කිසි වරදකට කෙදිනකදී හෝ ඔබට විරුද්ධව උසාවියේ නඩුවක් පවරා තිබුණේද? :———.

(ii) ඔබද හවුල් වූ ආරවුලක් සමථකරණය කිරීම සඳහා කෙදිනකදී හෝ සමථ මණ්ඩලයකට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණේද? :———.

(ආ) එසේ නම් එහි ප්‍රතිඵලය :———.

14. (අ) දැනට (හදිසි) මරණ පරීක්ෂක තනතුරක් දරන්නේ ද? :——.

(ආ) එසේ නම්, පළමු පත්වීම ලැබූ දිනය හා අමාත්‍යාංශයේ ගොනු අංකය :———.

15. මෙම තනතුර සඳහා අදාළ වෙනත් සුදුසුකම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :———.

16. චරිත සහතික දෙන පුද්ගලයන් දෙදෙනාගේ නම්, ලිපිනයන් හා පදවි නාම

(i) ———.

(ii) ———.

මා විසින් ඉහත සඳහන් කර ඇති කරුණු සියල්ලම සම්පූර්ණයෙන්ම සත්‍ය බව හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

———.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *අයත්වන ග්‍රාම නිලධාරි කොට්ඨාස* |
|---|---|---|
| 1. කටුවන | කටුවන පරණගම් පලාත | 512, 513, 514, 515, 516, 517, 518, 519, 520, 521, 522, 523, 524, 525, 526, 527 |
| 2. හම්බන්තොට | කොහොලංකල | 89, 90, 91, 92, 95, 96, 97 |
| 3. තිස්සමහාරාම | නැගෙනහිර වලකඩ | 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19, 20, 21, 42, 43, 44 |
| 4. බෙලිඅත්ත | කහවත්ත ඉහළ වලකඩ | 318, 319, 320, 321, 322, 323, 324, 325, 326, 327, 328, 329, 330, 331, 333, 334, 335, 346, 347, 348, 349, 350 |
| | ගලගම්පලාත | 351, 352, 353, 354, 355, 356, 357, 362, 363, 364, 365, 372, 373, 374, 375, 376, 377, 378, 379, 380 |
| | ගැටමාන්න | 332, 336, 337, 338, 339, 340, 341, 342, 343, 344, 345, 366, 367, 368, 369, 370, 371 |
| 5. ලුණුගම්වෙහෙර | ලුණුගම්වෙහෙර | 56, ලුණුගම්වෙහෙර නව නගරය |
| 6. තංගල්ල | නාකුලුගමුව | 283, 284, 285, 286, 287, 288, 289, 290, 291, 292, 293, 294, 295, 296, 297 |
| 7. සූරියවැව | සූරියවැව | 103, 104, 105, 107, 108, 109, 110, 111, 112, 113, 114, 115 |
| 8. ඕකේවෙල | ඕකේවෙල අංක 01 | 169, 174, 466, 467, 468, 470, 472, 473, 475, 476, 477, 478, 479 |
| | ඕකේවෙල අංක 02 | 479, 480, 481, 482, 483, 484, 485, 486, 487, 488, 489, 490, 491, 492 |
| 9. වලස්මුල්ල | වලස්මුල්ල අංක 01 | 430, 431, 432, 433, 434, 435, 437, 447, 449, 450, 451, 452, 453, 454, 455, 456, 457, 458, 459, 460, 461, 462, 463, 464, 465, 542, 551, 552, 553, 554, 555, 556 |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අයත්වන ග්‍රාම නිලධාරි කොට්ඨාස |
|---|---|---|
| | වලස්මුල්ල අංක 02 | 557, 558, 559, 560, 561, 562, 563, 564, 565, 566, 567, 568, 569, 570, 571, 572, 573, 574, 575, 576 |
| | **මොණරාගල දිස්ත්‍රික්කය** | |
| 1. මඩුල්ල | නිකවැරටිය | 118, 118ඒ |
| | පොල්ගහගම | 115 |
| | දැලිව | 116ඒ, 116බී, 116ඩී, 118ඒ, 118බී |
| | ඉඟිනියාගල | 104ඒ |
| | පොතුලියද්ද | 104, 104බී, 104සී |
| 2. වැල්ලවාය | වැල්ලවාය | 151, 151ඒ, 151බී, 151සී, 151ඩී,152, 152ඒ, 152බී, 152සී, 153, 153ඒ, 153බී |
| | වෙහෙරයාය | තෙලුල්ල, හඳපානාගල, බලහරුව |
| 3. සියඹලාණ්ඩුව | වත්තේගම | 124, 124එච්, 126ඒ, 126බී |
| | ඇතිමලේ | 124ඒ, 124බී, 124සී, 124ඩී, 124ඊ, 124එෆ්, 124ජී |
| 4. බඩල්කුඹුර | බඩල්කුඹුර (මුස්ලිම්) | |
| | මොරටුවගම | මොරටුවගම, බෝගහපැලැස්ස |
| 5. බිබිල | යල්කුඹුර | 98, 98ඒ, 98බී, 98සී, 99, 99ඒ, 99බී, 99සී |
| | මල්ලැහැව | 96, 96ඒ, 96බී, 97, 97ඒ, 102බී, 102සී |
| | නිල්ගල | 101, 101ඒ, 101බී, 101සී, 101ඊ, 103, 103ඒ, 103බී, 103සී, 103ඩී, 103ඊ |
| 6. බුත්තල | පැල්වත්ත | 140බී, 143, 143/1, 143/2, 143ඒ, 143ඒ/1, 143ඒ/2, 143ඒ/3 |
| | මාලිගාවිල | 145ඒ/1, 145ඒ, 145ඒ/2, 145බී/1 |
| 7. තණමල්විල | සිත්තරම | සීනත්තුව, සිත්තරම, කිවුල්ආර, බෝදාගම, නිකවැව, සූරියආර, උස්ගල, මහවැව, කහකුරුල්ලන් පැලැස්ස |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අයත්වන ග්‍රාම නිලධාරි කොට්ඨාස |
|---|---|---|
| | **බදුල්ල දිස්ත්‍රික්කය** | |
| 1. බණ්ඩාරවෙල | කන්දපල්ල අංක 02 කොට්ඨාශය | ගම්පහ, කොලොන්ගස්තැන්න, ලෙංවිට, නිකපොත, කොස්ලන්ද |
| | බඹරගම කිණිගම | දුල්ගොල්ල, එගොඩගම, තත්තිරිය, මහඋල්පත, උඩපේරුව, කිණිගම, මකුල්ඇල්ල, බැද්දේආරාව, දරහිටවනාගොඩ |
| 2. රිදීමාලියද්ද | පල්වත්ත | 12, 12ඒ, 13, 13ඒ, 13බී, 14, 14ඒ, 15, 15ඒ |
| 3. කන්දකැටිය | වියලුව | 30, 30ඒ, 30බී, 30සී, 31, 31ඒ, 31බී. 31සී, 31ඩී, 31එච්, 31පී, 32ඒ |
| 4. පස්සර | බිබිලේගම | 87, 87ඒ, 87බී, 87සී, 87ඩී, 87එෆ්, 87ඊ, 87ජී |
| | තැන්නුගේ | 88ඩී, 90, 90බී, 90ඩී |
| 5. ලුණුගල | මඩොල්සිම | 18බී. 18ඩී, 87සී, 89ජේ |
| 6. ඌව පරණගම | ගම්පහ කෝරළය | 37, 37ඒ, 37බී, 37ඩී, 37ඊ, 37ෆ්, 38, 38ඒ, 38බී, 38සී, 38ඩී, 38ඊ |
| | සපුගොල්ල-කිරවනාගම | 41, 41ඒ, 41ඩී 41ඊ, 42, 42ඒ, 45ඒ |
| | කොටවෙහෙර | කොටවෙහෙර බටහිර, උඩපේරුව කොටවෙහෙර නැගෙනහිර |
| 7. වැලිමඩ | වැලිමඩ නගරය | 48සී, 52, 52ඒ, 52බී, 52සී, 52ඩී |
| 8. මහියංගනය | බින්තැන්න බටහිර | 2, 2ඒ, 2බී, 2සී |
| | දඹාන | 7ඒ |
| 9. බදුල්ල | බෝගොඩ උතුරු දකුණු කෝරළය | 73ඒ, 73ඩී, 74සී, 74එෆ්, 75, 75ඒ, 75බී, 75සී, 75ඩී, 75ඊ, 76, 76ඒ, 77, 77ඒ, 77බී |
| 10. සොරණාතොට | සොරණාතොට | 23, 23ඒ, 24, 24ඒ, 25, 25ඒ, 25බී, 25සී, 25ඩී, 26,26ඒ, 26බී, 26සී, 27, 27ඒ, 27බී 28, 28ඒ, 29, 29ඒ, 29බී, 34, 34ඒ |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අයත්වන ග්‍රාම නිලධාරි කොට්ඨාස |
|---|---|---|
| | **කොළඹ දිස්ත්‍රික්කය** | |
| 1. මොරටුව | මොරටුව දකුණ | 552ඒ, 553, 553ඒ, 553බී, 553සී, 554, 554ඒ, 554බී, 554සී, 555, 555ඒ, 556, 556ඒ, 556බී |
| 2. කොලොන්නාව | කොටිකාවත්ත | 504ඒ, 505, 505ඒ, 505බී, 505සී, 505ඩී, 506, 506ඒ, 506බී, 506සී, 506ඩී, 507, 508, 508ඒ, 509, 509සී, 513, 513ඒ, 513බී, 513සී, 513ඩී, 513ඊ |
| 3. පාදුක්ක | යටවතුර කොට්ඨාසය | 454ඒ, 455, 455ඒ, 460ඒ, 460බී, 461ඒ, 461බී, 461ඩී, 466, 467, 467ඒ, 468 |
| | ලියන්වල | ලියන්වල (462), පෝරේගෙදර (462ඒ), මාදුලාව (463), මාදුලාව දකුණ (463ඒ), හොරගල නැ/(464), දාම්පෙ (464ඒ), හොරගල බ/(464බී), හොරකඳවල (464 සී), බෙරකැටිය (464ඩී), කුරුගල (465) |
| 4. හෝමාගම | හෝමාගම මූලික රෝහල | හෝමාගම බටහිර |
| | මත්තේගොඩ | 587, 587ඒ, 587බී, 587සී, 588, 589, 589ඒ, 590, 590ඒ, 590බී, 603, 603ඒ, 603බී, 603සී |
| | කහතුඩුව | 591, 591ඒ, 591බී, 591ඩී, 592, 592ඒ, 593, 593ඒ, 594, 595, 599, 600, 601, 602, 602ඒ, 602බී |
| | හෝමාගම | 486, 486ඒ, 486බී, 486සී, 486ඩී, 486ඊ, 486එෆ්, 486ජී, 499, 499ඒ, 500, 500ඒ, 591සී |
| | පිටිපන | 484, 484ඒ, 484බී, 484සී, 484ඩී, 484ඊ, 484එෆ්, 484ජී, 485, 485ඒ |
| | මීගොඩ | 447, 447ඒ, 447බී, 447සී, 448, 448ඒ, 448බී, 448සී |
| | පනාගොඩ | 481, 481ඒ, 481බී, 481සී, 481ඩී, 482, 482ඒ, 482බී, 482සී, 482ඩී, 482ඊ, 483, 483ඒ |
| | ජල්තර | 446, 446ඒ, 449, 450, 450ඒ, 451 |
| 5. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | කෝට්ටේ උතුර | 514, 514ඒ, 514බී, 514සී, 514ඩී, 519, 519ඒ, 519බී, 519සී, 520, 520ඒ, 520බී, 521, 521ඒ, 522, 522ඒ, 522බී, 526ඒ, 526සී |
| 6. කැස්බෑව | බෝකුන්දර | 562, 562බී, 575, 577, 577ඒ, 577බී, 578, 578ඒ, 579, 580, 580ඒ, 583, 583ඒ, 584, 584ඒ |
| 7. කොළඹ | කොළඹ මහ රෝහල (අතිරේක - පුරප්පාඩු 02) | කුරුඳුවත්ත, බොරැල්ල උතුර, බොරැල්ල දකුණ, කුප්පියාවත්ත නැගෙනහිර |
| | **ගම්පහ දිස්ත්‍රික්කය** | |
| 1. අත්තනගල්ල | ඌරාපොල | 363ඒ, 366, 366ඒ, 366බී, 366සී, 367, 367ඒ, 367බී, 368, 374, 375, 375බී, 375ඩී, 376, 376ඒ |
| | කුරවලාන | 368ඒ, 369, 369ඒ, 370, 370ඒ, 370බී, 370සී, 370ඩී, 371, 372, 372ඒ, 373 |
| | එල්ලක්කල | 349, 349ඒ, 349සී, 349ඩී, 349ඊ, 349එෆ්, 353, 353ඒ, 353බී, 354, 354ඒ, 355, 355ඒ |
| | ගොඩගම | 361, 361ඒ, 362, 362ඒ, 363, 364, 364ඒ, 365, 365ඒ, 365බී, 365සී |
| | මීවල | 315, 315ඒ, 316, 316ඒ, 317, 318, 318ඒ, 318සී, 318ඩී, 321, 321ඒ, 321බී |
| 2. බියගම | බියන්වල | 265, 265ඒ, 268, 268ඒ, 268බී, 269, 269ඒ, 269බී, 270, 270ඒ, 270බී, 271, 271ඒ, 271බී, 272, 272ඒ, 273 |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අයත්වන ග්‍රාම නිලධාරි කොට්ඨාස |
|---|---|---|
| 3. මහර | උඟුරුවල්පේරුව | 289, 289ඒ, 289බී, 290, 290ඒ, 291, 292, 292ඒ, 292බී, 294, 295, 295ඒ, 296, 296ඒ, 296බී, 297, 297ඒ, 298, 298ඒ, 298බී, 299, 300, 301, 301ඒ, 301බී, 302, 302ඒ, 303, 303ඒ, 304, 304ඒ, 305, 306, 306ඒ, 307, 307ඒ |
| | දළුපිටිය | 251, 251ඒ, 252, 252ඒ, 252බී, 253, 253ඒ, 255, 255ඒ, 255බී, 255සී, 255ඩී, 255ඊ, 255එෆ්, 255ජී, 255එච් |
| 4. ජා-ඇල | කඳාන පොලිස් වසමට අයත් ප්‍රදේශ | 183,. 184, 184ඒ, 184බී, 184සී, 185, 185ඒ, 185බී, 185සී, 185ඩී, 186, 187, 188, 189, 190, 190සී, 190ඩී, 190ඊ, 211, 211ඒ, 211බී, 212ඒ |
| | රාගම පොලිස් වසමට අයත් ප්‍රදේශ | 181, 181ඒ, 181බී, 181සී, 181ඩී, 181එෆ්, 181ජී, 190ඒ, 212, 212බී, 213, 213ඒ, 214, 214ඒ |
| 5. ගම්පහ | ගලහිටියාව | 208, 209, 209ඒ, 209බී, 209සී, 209ඩී, 210, 210ඒ, 215, 215ඒ, 215බී, 216, 216ඒ, 216බී, 217 |
| | ගම්පහ ග්‍රාමීය | 217ඒ, 218, 218ඒ, 219, 219ඒ, 220, 220ඒ, 221, 221ඒ, 222ඒ, 222බී |
| | පාලුව ගම්පහ පොලිස් වසම | 232ඒ, 232බී, 232සී, 232ඩී, 233, 233ඒ, 235, 235ඒ, 235බී, 235සී, 236ඒ, 236බී |
| | පාලුව ගනේමුල්ල පොලිස් වසම | 236සී, 236ඩී, 237, 237ඒ 237බී, 238, 238ඒ, 239, 239ඒ, 239බී, 240, 240ඒ, 240බී |
| | පාලුව වැලිවේරිය පොලිස් වසම | 241, 241ඒ, 241බී, 241සී, 242, 242ඒ, 242බී, 242සී, 243, 243ඒ, 243බී, 244, 244ඒ, 244බී, 244සී, 244ඩී |
| 6. වත්තල | පමුණුගම | 164, 164ඒ, 165, 165ඒ, 165බී, 166, 166ඒ, 167, 167ඒ, 167බී, 193, 193ඒ |
| | හැඳල | 168, 168ඒ, 168බී, 169, 169ඒ, 170, 170ඒ, 171, 171ඒ, 171බී, 172, 172ඒ, 172බී |
| | මාබෝල නගර සභාව | 175, 175ඒ, 176, 176ඒ, 176බී, 176සී |
| | වැලිසර | 177, 177ඒ, 177බී, 178, 179, 180, 180ඒ, 182, 182ඒ, 182බී, 250, 250ඒ, 254, 254ඒ |
| 7. මීගමුව | මීගමුව මහ රෝහල | උඩයත්තෝප්පුව (160) |
| 8. කටාන | කොච්චිකඩේ | 63, 64, 64ඒ, 65, 65ඒ, 66, 67, 68, 68ඒ, 68බී, 69, 69ඒ, 69බී, 70, 70ඒ, 70බී, 71, 161, 161බී, 161සී, 161ඩී |
| | කිඹුලපිටිය | 92, 92ඒ, 92බී, 92සී, 93, 93ඒ, 93බී, 93සී, 93ඩී, 93ඊ, 93එෆ්, 94 |
| | කටුනායක | 149, 150, 151, 152, 152ඒ, 154, 154ඒ, 155, 155ඒ, 155බී, 201 |
| | සීදුව | 142, 142ඒ, 142බී, 143, 143ඒ, 144, 144ඒ, 145, 145ඒ, 145බී, 145සී, 146 |
| | රද්දොළුගම | 147, 148, 153, 153ඒ, 153බී, 197, 197ඒ, 198, 198ඒ, 199, 199ඒ, 199බී, 199සී, 199ඩී, 199ඊ, 200, 202, 203, 204, 204ඒ, 204බී |
| | **කළුතර දිස්ත්‍රික්කය** | |
| 1. පානදුර | පානදුර-තොටමුණ (සිංහල) | 746, 746ඒ, 746බී, 746සී, 747, 747ඒ, 747බී, 748, 749, 750, 750ඒ, 750බී, 751, 751ඒ, 752, 752ඒ, 753, 753ඒ, 754, 755, 756, 757, 758, 759, 759ඒ, 759බී, 760, 761, 762, 762ඒ, 762බී, 762සී, 763, 764, 765, 765ඒ, 766 (දර්ගා නගරය), 766 (ගඟ අද්දර) 766, 766ඒ, 766බී, 766සී, 766ඩී, 766එෆ්, 766ජී, 767, 768, 768ඒ, 768බී, 769, 770, 770ඒ |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අයත්වන ග්‍රාම නිලධාරි කොට්ඨාස |
|---|---|---|
| 2. බුලත්සිංහල | ඇගල්ඔය | 821, 821ඒ, 821බී, 821සී, 821ඩී, 821ඊ, 821එෆ්, 821ජී, 822, 822ඒ, 822බී, 822සී, 822ඩී, 822ඊ, 822එෆ් |
| 3. මිල්ලනිය | මුංවත්තපාර පත්තුව බටහිර | 643, 643ඒ, 643බී, 644, 644ඒ, 644බී, 644සී, 645, 645ඒ, 645බී, 646, 646ඒ, 647, 647ඒ, 647බී, 649, 649ඒ, 649බී, 649සී, 651, 651ඒ, 651බී, 652, 652ඒ, 653, 653ඒ, 653බී, 654, 654ඒ, 655, 655ඒ |
| 4. බණ්ඩාරගම | බණ්ඩාරගම රජයේ රෝහල | බණ්ඩාරගම නැගෙනහිර |
| 5. වලල්ලාවිට | වලල්ලාවිට | 784, 784ඒ, 785, 786, 787, 787ඒ, 787බී, 787සී, 788බී, 789, 789ඒ, 790, 790ඒ, 790බී |
| | පැලවත්ත | 843, 843ඒ, 843බී, 843සී, 843ඩී, 843ඊ, 843එෆ්, 843ජී, 843එච්, 843අයි |
| | මීගහතැන්න | 844ඒ, 844ඊ, 848, 848ඒ, 848බී, 848සී, 849, 849ඒ, 849බී, 849සී, 849ඩී, 849ඊ, 850, 850ඒ, 850බී, 850සී, 850ඩී, 850ඊ |
| | ඉත්තෑපාන | 777, 777ඒ, 777බී, 777සී, 778, 778ඒ, 779, 780, 781, 782, 782ඒ, 783, 783ඒ, 784, 784ඒ, 785, 786, 791, 791ඒ, 791බී |
| 6. කළුතර | කළුතර මහ රෝහල | නාගොඩ බටහිර (729බී) |
| 7. මතුගම | හොරවල ගම්සභා ප්‍රදේශය | 794, 794ඒ, 794බී, 794සී, 795ඒ, 795බී, 795සී, 796, 796ඒ, 797, 797ඒ, 798, 798ඒ, 802, 802බී, 802සී, 802ඊ, 803, 803ඒ, 804, 804ඒ |
| 8. අගලවත්ත | කිනියාවල කොට්ඨාසය | 842ඒ, 842බී, 844, 844ඒ, 844බී, 844සී, 845, 845ඒ, 846, 846ඒ, 846බී, 847, 847ඒ |

පහතින් සඳහන් කරනු ලබන සියලුම කොට්ඨාස සඳහා හදිසි මරණ පරීක්ෂක තනතුර (මුස්ලිම්) බඳවා ගැනීමට සුදුසුකම් සපුරා ඇති මුස්ලිම් ජාතික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :—

1. කොළඹ දිස්ත්‍රික්කය - ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
   - කොළඹ මහ රෝහල
2. ගම්පහ දිස්ත්‍රික්කය - මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
3. කළුතර දිස්ත්‍රික්කය - මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

05-32

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2011
(2012/2014 කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව)

2012/2014 දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2011 ජූලි මස පහත සඳහන් නගරවල පිහිටවනු ලබන මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ.

| නගර අංකය | නගරය |
|---|---|
| (1) | අනුරාධපුරය |
| (2) | බදුල්ල |
| (3) | මඩකලපුව |
| (4) | කොළඹ |
| (5) | ගාල්ල |
| (6) | යාපනය |

| නගර අංකය | නගරය |
|---|---|
| (7) | මහනුවර |
| (8) | කුරුණෑගල |
| (9) | මාතර |
| (10) | ත්‍රිකුණාමලය |
| (11) | වවුනියාව |
| (12) | රත්නපුරය |
| (13) | හම්බන්තොට |

කිසියම් මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය තරම් විභාග අපේක්ෂකයන් අයදුම් කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය ද පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. *දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව :*

2.1 කෘෂිකර්මය පිළිබඳ මෙම පාඨමාලාව ගැහැණු - පිරිමි දෙපක්ෂයටම විවෘතය. මෙම විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අය කුසලතාව හා දිස්ත්‍රික් පදනම මත කුණ්ඩසාලේ, කරපිංච, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස සහ වවුනියාව යන කෘෂිකර්ම විද්‍යාල පහට තෝරාගනු ලැබේ.

2.2 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවල පවත්වනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇත. මෙම පුහුණුව හුදෙක් වෘත්තීයමය වන අතර, එය පිළියෙල කරනු ලැබ ඇත්තේ පුහුණුවෙන් පසු ස්වයං රැකියාවල යෙදීමට හෝ සුදුසු රැකියාවක් ලබා ගැනීමට හෝ බලාපොරොත්තු වන ශිෂ්‍යයනට හා ශිෂ්‍යාවනටය. පාඨමාලාව හදාරන කාලය තුළ දී නේවාසිකව සිටීම අනිවාර්ය වේ. ඔවුනට මෙම කාලය තුළ දී වෙනත් කිසිදු ආයතනයක පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පුහුණු පාඨමාලාවක් හැදෑරීමට හෝ රැකියාවක් ලබා ගැනීමට හෝ අවසර දෙනු නොලැබේ. කිසියම් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක කිසියම් අවස්ථාවක එවැනි පාඨමාලාවක් හදාරන බව හෝ වෙනත් කිසියම් ආයතනයක රැකියාවක නියුක්ත බව හෝ ඔප්පු වුවහොත් ඔහු /ඇය කෘෂිකර්ම විද්‍යාලයෙන් නෙරපනු ලැබේ.

2.3 ඇතැම් සෙනසුරාදා සහ ඉරිදා දිනවල ද පන්ති පවත්වන බැවින් නේවාසිකාගාරවලින් බැහැරව යා හැක්කේ මසකට එක් සති අන්තයක දී පමණය. මඩ කුඹුරුවල, ගොඩ ගොවිතැන්වල ප්‍රායෝගිකව යෙදීමට මනාපයක් තිබිය යුතුය. මෙම පුහුණුවෙන් පසු රැකියා අවස්ථාවන් වැඩි වශයෙන් බලාපොරොත්තු විය හැක්කේ වියලි කලාපයේ ගම්බද පළාත්වල බැවින් එම ප්‍රදේශවල සේවය කිරීමට අයදුම්කරුවන්ට කැමැත්තක් තිබිය යුතුය. පුහුණුවෙන් පසු රැකියා ලබාදීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ රජය කිසිම ආකාරයකින් බැඳී නැත. රාජ්‍ය අංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ කෘෂිකර්ම උපදේශක ආදී තනතුරු කීපයකට හා වෙනත් රාජ්‍ය අංශයේ සමහර තනතුරු සඳහා අයදුම් කිරීමට කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවට අමතරව අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 03ක් එකවර සමත්වීම අවශ්‍ය වේ.

03. *ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකෙන් එකකටවත් සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙ.) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරක දී විෂයයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05ක් එකවර සමත්වී තිබීම;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා අංශයෙන් විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් තුනක් එක්වර සමත්වී තිබීම (මෙම සුදුසුකම ඇති සිසුන් තෝරා ගැනීමේ දී ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ.);

*හෝ*

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකෙන් එකකටවත් සම්මාන සාමාර්ථ්‍යය ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් අ. පො. ස. (සා. පෙළ) සමත්වී තිබිය යුතුය. මෙහිදී එක්වරක දී විෂයයන් 03කට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් එකවර සමත් වී තිබීම;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යා අංශයෙන් විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් විෂයයන් එකක් හෝ දෙකක් සමත්වී තිබීම (උසස් පෙළ සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත් වී සිටීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවා සේ නොසැලකේ.) මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ 3.1 (අ) හි අයදුම්කරුවන් සියලුම දෙනා තෝරා ගැනීමෙන් පසුව පුරප්පාඩු ඇතොත් පමණි;

(ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම් අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

3.2 2011.06.06 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවුරුදු 17ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25ට වැඩි නොවිය යුතුය. රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

3.3 3.1 හා 3.2 හි සඳහන් ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් සැලකිලිමත්ව කියවා බැලීමට අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා/හෝ නියමිත වයස් සීමාවෙන් බැහැර වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් අයදුම්පත් එවීම නොකළ යුතුයි. දැනට රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක දැවුරුදු කෘෂිකර්ම පාඨමාලාවන් හදාරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 කෘෂිකර්ම විද්‍යාලවල උගන්වන මාධ්‍ය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි බැවින් එම භාෂාවන් අතුරින් එක් භාෂාවකින් එම පාඨමාලාව හදාරා පාඨමාලාවේ විභාගයන්ට පෙනී සිටීමට අපේක්ෂකයාට හැකි විය යුතුය. තෝරාගත් මාධ්‍යයෙන් දිගටම අධ්‍යයන කටයුතු කළ යුතුය. පාඨමාලාව අතරමග දී ඉගෙනුම ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

3.6 ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබන්නේ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ පමණි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවනට තරග විභාගය සඳහා තමන් කැමති මාධ්‍යයකින් පෙනී සිටිය හැක. එහෙත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන අයදුම්කරුවන් I වැනි හා II වැනි ප්‍රශ්න පත්‍රවලට අමතරව III වැනි ප්‍රශ්න පත්‍රය වන ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට ද පෙනී සිටිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යය සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 30 කි. පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන සෑම ශිෂ්‍යයෙකුම ආරම්භයේ දී සිටම තමන් විසින් තෝරා ගන්නා ලද මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු හා විභාග කටයුතු කළ යුතු අතර පසු අවස්ථාවක දී ඉගෙන ගන්නා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *අයදුම්පත් :*

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තේ තම අයදුම්පත සකස් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුවේ. එහි අංක 01 සිට අංක 10 තෙක් මුල් පිටුවේ ද, 11 සිට 14 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරිය 3 වැනි පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග සම්බන්ධ ගැසට් නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු/කාරිය විමසා බැලිය යුතු වේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගත යුතු වේ.

4.2 විභාග ගාස්තුව රු. 400කි. අපේක්ෂකයා විසින් තැපැල් කාර්යාලයකින් ලබාගත් රු. 400ක වටිනාකමින් යුත් මුදල් ඇණවුමක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් ලබාගෙන මාරු කර ගන්නා තැපැල් කාර්යාලය පේරාදෙණිය වශයෙන් සඳහන් කර අයදුම්පත්‍රයත් සමඟ අදාළ ස්ථානයේ දාරය පමණක් ඇලවීමට කටයුතු කළයුතු වේ. තවද මුදල් ඇණවුමේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීමට කටයුතු කරන්න. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තුවල මුදල් ඇණවුම අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2011 ජුනි මස 06 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2012/2014 කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම" යන්න හා පළමුවන හා දෙවන තේරීම් වශයෙන් තෝරා ඇති විභාග පැවැත්වෙන නගරවල නම් පැහැදිලිව සඳහන් කරන්න. විභාගය සඳහා ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

05. *තෝරා ගැනීමේ පිළිවෙල :*

5.1 බඳවා ගන්නා වර්ෂය තුළ දී එක් එක් මාධ්‍යයෙන් සියලුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගන්නා මුළු සංඛ්‍යාව සොයාගෙන අයදුම්කරුවන් සිටින දිස්ත්‍රික්කවලට එක් එක් මාධ්‍යයෙන් ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව තීරණය කරගනු ලැබේ. ඉන්පසුව එක් එක් මාධ්‍ය සඳහා දිස්ත්‍රික්කයට අයත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ ලබාගත් ලකුණු පදනම් වූ කුසලතාවන් මත වැඩිම කුසලතාවයන් පෙන්නු අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් තෝරාගනු ලැබේ. එසේ තේරීමේ දී පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනු ලැබේ.

අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමු වැනි වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ. අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමුවැනි වරට පෙනී සිටි දිස්ත්‍රික්කයට අදාළ අංකය සොයා ගැනීම සඳහා මෙම ගැසට් නිවේදනයේ අවසානයට පළකර ඇති ඇමුණුමේ අංක 01 උපයෝගී කරගත යුතු වේ.

5.2 *ලිඛිත විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ :*

| *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|
| 01. කෘෂිකර්මය (ලකුණු 100 යි) (අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශ මට්ටම ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි ප්‍රශ්න අඩංගු වේ.) | පැය 1 යි | 09 30 පැය - 10 30 පැය |
| 02. බුද්ධි පරීක්ෂණය (ලකුණු 100යි) | පැය 1 යි | 11 00 පැය - 12 00 පැය |
| 03. ඉංග්‍රීසි භාෂාව (ලකුණු 100යි) අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂය නිර්දේශ මට්ටම ආශ්‍රිතව සකස් කෙරේ. ඉංග්‍රීසි භාෂාවෙන් කරුණු අවබෝධ කර ගැනීම, ඉංග්‍රීසියෙන් අදහස් සංනිවේදනය කිරීමේ හැකියාවන් හා සරල ව්‍යාකරණ හැකියාවන් පරීක්ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට පමණි) | පැය 1 යි | 13 30 පැය - 14 30 පැය |

5.3 ලිඛිත විභාගය සඳහා කෘෂිකර්මය හා බුද්ධි පරීක්ෂණය යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකි. එම ප්‍රශ්න පත්‍ර දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් දිස්ත්‍රික් පදනමින් තෝරාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහිදී අ. පො. ස. (උ. පෙළ) ජීව විද්‍යා විෂයය ධාරාව හදාරා විෂයයන් 03කින් එකවර සමත් වූ හා තරග විභාගයේ විෂයයන් දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන කුසලතාවන් දැක් වූ අයට ප්‍රමුඛතාවන් දෙමින් ඒ අය පළමුව තෝරාගනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් යම් මාධ්‍යයක් සඳහා එවැනි අයදුම්කරුවන් නොමැති විට හෝ එවැනි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට දී පමණක් එම දිස්ත්‍රික්කයෙන් එම මාධ්‍යය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සම්පූර්ණ වන සේ අ.පො.ස. (උ.පෙළ) විෂයයන් එකක් හෝ දෙකක් සමත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු ලබාගෙන කුසලතාව දැක්වූ අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. මෙම තෝරා ගැනීම අනිවාර්යයෙන්ම 5.1 හි සඳහන් ආකාරයට දිස්ත්‍රික්ක පදනමින් හා විභාගයේ දී දැක් වූ කුසලතාවන් අනුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අනුමත කර ඇති ක්‍රමයක් අනුව සිදු කෙරේ. අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. මේ නිසා තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණුවල එකතුවේ කඩඉම් ලකුණු මට්ටම් දිස්ත්‍රික්කයක පිරිමි හා ගැහැණු අයදුම්කරුවන් අතර හා පාඨමාලාව හදාරන එක් එක් මාධ්‍යය අනුව වෙනස් වේ. කිසියම් දිස්ත්‍රික්කයකට තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති විට දී විද්‍යාලවලට එක් එක් මාධ්‍යයට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනිකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව තෝරාගනු ලැබේ.

ඉහත සඳහන් කරුණු සලකා බලමින් දිස්ත්‍රික්කයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් සිසුන් සීමිත ප්‍රමාණයක්, ඔවුන්ගේ අධ්‍යාපනික සහතික හා වෙනත් සහතික හෝ පරීක්ෂා කිරීමට සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ඇත. අයදුම්පතේ සඳහන් සහතිකවල මුල් පිටපත් මෙහි දී පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

5.4 සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් අනිවාර්යයෙන් තමන් පාඨමාලාව හැදෑරීමට තෝරාගත් භාෂා මාධ්‍යයෙන්ම තරග විභාගයේ දී පළමුවැනි හා දෙවැනි ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට අයදුම් කරන අයදුම්කරුවන් පමණක් තම මනාපය අනුව සිංහලෙන් හෝ දෙමළෙන් පළමුවැනි හා දෙවැනි ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය හැකිය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පමණක් ඒ සඳහා සුදුසුකම් ලැබීමට ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට පෙනී සිට, අවම වශයෙන් 40%ක් ලකුණු ලබාගත යුතු වේ. ඉංග්‍රීසි විෂයය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවල දී පමණක් මෙම අවම සීමාවන් වෙනස් කිරීමට ඉඩ ඇත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා කුසලතාව මත හා අනුමත කර ඇති ක්‍රමයක් අනුව හැකිතාක් දුරට දිස්ත්‍රික් පදනම මත තේරීම සිදුකරනු ලැබේ. එහි දී ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට, අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් අතරින් පළමුවැනි ප්‍රශ්න පත්‍රය හා දෙවැනි ප්‍රශ්න පත්‍රයේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයින් පමණක් කුසලතා මත තෝරාගනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයට නොතේරෙන අයදුම්කරුවන් ඔවුන් තරග විභාගයේ දී පෙන්නුම් කළ කුසලතා මත ඔවුන් අයත් දිස්ත්‍රික්කයෙන් සිංහල හෝ දෙමළ මාධ්‍යයන්ට ඇතුළත් කිරීමට සලකා බලනු ලැබේ. අයදුම්කරුවෙකු විසින් විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.5 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා

මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම කරන ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ප්‍රවේශ පත්‍රය නොලැබීම පිළිබඳ දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකේ.

5.6 විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාව විභාගශාලාධිපති වෙත ඔප්පු කර සිටිය යුතුයි. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් පමණක් පිළිගනු ලැබේ :—

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ආ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

5.7 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ප්‍රසිද්ධ ලිඛිත විභාගවලට බලපාන නීති හා කොන්දේසිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති හා කොන්දේසි උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදීම අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගත් බවක් නොහැඟේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.8 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. *"කුසුමා ලක්ෂමී කරුණාතිලක" සිහිවටන ශිෂ්‍යත්වය :*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ දී I වැනි හා II වැනි ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගත් ඕනෑම මාධ්‍යයක අයදුම්කාරියකට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. ශිෂ්‍යත්වලාභිණියට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000 ක් වේ.

කේ. එන්. මාන්කෝට්ටේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2011 අප්‍රේල් මස 18 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

**ඇමුණුම් අංක 01**
දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක
(5.1 ඡේදයට අදාළ වේ)

| *දිස්ත්‍රික් අංකය* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 01 | අනුරාධපුරය |
| 02 | බදුල්ල |
| 03 | මඩකලපුව |
| 04 | කොළඹ |
| 05 | ගාල්ල |
| 06 | යාපනය |
| 07 | මහනුවර |
| 08 | කුරුණෑගල |
| 09 | මාතර |
| 10 | ත්‍රිකුණාමලය |
| 11 | වවුනියාව |
| 12 | රත්නපුරය |
| 13 | හම්බන්තොට |

| *දිස්ත්‍රික් අංකය* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 14 | ගම්පහ |
| 15 | කළුතර |
| 16 | මාතලේ |
| 17 | නුවරඑළිය |
| 18 | මන්නාරම |
| 19 | මුලතිව් |
| 20 | අම්පාර |
| 21 | පුත්තලම |
| 22 | පොලොන්නරුව |
| 23 | මොණරාගල |
| 24 | කෑගල්ල |
| 25 | කිලිනොච්චිය |

*ආදර්ශ ඉල්ලුම් පත්‍රය*

*ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2011*

*(2012/2014 කෘෂිකර්ම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව)*

(COMPETITIVE EXAMINATION FOR ADMISSION TO SRI LANKA SCHOOLS OF AGRICULTURE - 2011

(DIPLOMA IN AGRICULTURE 2012-2014)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

1.

| *විභාගයට පෙනී සිටින නගරය :* | *එහි අංකය* |
|---|---|
| 1 වැනි තේරීම ........................ | ........................ |
| 2 වැනි තේරීම ........................ | ........................ |

(*ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව*)

2. *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :*
සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3

...............

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3. *පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍යය :*
සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3
ඉංග්‍රීසි මාධ්‍යය - 4

..................

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| පුරුෂ - 0 | |
| ස්ත්‍රී - 1 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5. සාමාන්‍ය පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය :
..................

දිස්ත්‍රික් අංකය :
............

(5.1 ඡේදයට අනුව/ඇමුණුම 01 බලන්න)

6. අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විෂයයන් තුනක් එකවර - 3
විෂයයන් දෙකක් හෝ එකක් එකවර - 2

සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය :
..................

(3.1 ඡේදයට අනුව)

7. (අ) (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(පැහැදිලි අකුරින්)

(ii) අගට යෙදූ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
*උදා.* : ANANDA, K. C. B.

(ආ) (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.

8. (i) සම්පූර්ණ ලිපිනය :————.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.

(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංකය (ඔබගේ හෝ ඔබට දුරකථන පණිවිඩයක් දිය හැකි අංකයක්) :————.

9. (අ) අ. පො.ස. (සා. පෙළ) විභාගයට පළමුවැනිවරට පෙනී සිටි පාසල හා ලිපිනය :————.

(ආ) පළමුවැනිවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (සිංහලෙන්) :————.

(ඇ) පළමුවැනිවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :————.

10. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

11. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.

(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

12. උපන් දිනය : අවුරුද්ද : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

13. 2011.06.06 වැනි දිනට වයස : අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

14. ගැසට් නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යෙන් කියවා මෙම කොටස පිරවිය යුතුවේ.

(අ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | සිංහල | | |
| | | ගණිතය | | |
| | | විද්‍යාව | | |
| | | කෘෂිකර්මය | | |
| | | සමාජ අධ්‍යයනය | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබාගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| 1. | | 1. සිංහල | | |
| 2. | | 2. ගණිතය | | |
| 3. | | 3. විද්‍යාව | | |
| 4. | | 4. කෘෂිකර්මය | | |
| 5. | | 5. සමාජ අධ්‍යයනය | | |

(ඇ) අ. පො. ස. (උ. පෙ.) විභාගය ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ඇත් ද? ඔව්/නැත (අදාළ නොවන වචනය කපා හරින්න.)

(ඈ) අ. පො. ස. (උ. පෙ.) විභාගයෙන් සමත් විෂයයන් :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

(ඉ) ඉහත සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න. (මුල් පිටපත් එවිය යුතු නොවේ.)

සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :————.

15. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

16. මුදල් ඇණවුම පිළිබඳ විස්තර :
 16.1 මුදල් ඇණවුමේ අංකය :————.
 16.2 මුදල් ඇණවුම නිකුත් කළ තැපැල් කාර්යාලය :————.
 16.3 මුදල් ඇණවුම මාරුකරන කාර්යාලය :————.
 (මෙය අනිවාර්යෙන්ම පේරාදෙණිය තැපැල් කාර්යාලය විය යුතුයි.)

| |
|---|
| මුදල් ඇණවුමේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න.<br>ලදුපතේ ඡායා පිටපතක් අනිවාර්යෙන්ම ඔබ ළඟ තබාගන්න. |

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයැදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවටත් මෙයින් සහතික කරමි. අ. පො. ස. (සා. පෙළ.) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයන් දෙකකින් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති සියළුම සුදුසුකම් ඇති බවට සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,30,060 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයැදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා/මිය/මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, *ගැසට් නිවේදනයේ* **සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් ඇති** බවට *ගැසට් නිවේදනය* **හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි.** තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන හා සුදුසුකම් සහතික කරන අයගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.

05-75

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිළ** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| මැයි | 2011.05.06 | සිකුරාදා | 2011.04.21 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2011.05.13 | සිකුරාදා | 2011.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.05.20 | සිකුරාදා | 2011.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.05.27 | සිකුරාදා | 2011.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2011.06.03 | සිකුරාදා | 2011.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.06.10 | සිකුරාදා | 2011.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.06.17 | සිකුරාදා | 2011.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.06.24 | සිකුරාදා | 2011.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2011.07.01 | සිකුරාදා | 2011.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.08 | සිකුරාදා | 2011.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.15 | සිකුරාදා | 2011.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.22 | සිකුරාදා | 2011.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.29 | සිකුරාදා | 2011.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.